# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## තනතුරු පුරප්පාඩු

## අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවි) - (HM 1-1) - තනතුරු 01

**බාහිර අයදුම්කරුවන් - සුදුසුකම් හා පළපුරුද්ද**

**a)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි කළමනාකරණ / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / ජාත්‍යන්තර ව්‍යාපාර / ජාත්‍යන්තර වෙළඳාම / වාණිජ / ආර්ථික විද්‍යාව /උපාය මාර්ගික කළමනාකරණය / විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය

**සමඟ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් අලෙවි කළමනාකරණය / රත්න විද්‍යාව / ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව / ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ පශ්චාත් උපාධිය

**සමඟ**

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

**b)** ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (SLIM) හෝ වරලත් අලෙවි කරණ ආයතනයේ (CIM) හෝ ඒ හා සමාන පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය

**සමග**

රාජ්‍ය සංස්ථාවක,මණ්ඩලයක,ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අදාල වන සුදුසුකම් අදාල වේ.

   **හෝ**

2. මධ්‍යම කළමනාකර ණ මට්ටමේ (MM) I ශ්‍රේණියෙහි (Grade 1) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයෙහි තනතුරක වසර 05ක සතුටුදායක සේවයක් ලබා තිබිම

**වැටුප් පරිමාණය**

HM 1-1 - රු. 140,640 – 4,100 X 15 – 202,140 + රජයේ අනුමත දීමනා හිමි වේ.

*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

**වැටුප් පියවර**

රු. 123,019/- 2026.01.01 දිනට ක.සේ.දෙ චක්‍ර ලේඛ අංක 01/2025

**වයස -:**

වයස අවුරුදු 35 ට නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර) . අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බලපානු නොලැබේ.

**අතිරේක ප්‍රතිලාභ**

- PED චක්‍රලේඛ අංක 01/2015 යටතේ නිල ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ඇත.
- වෘත්තීය දීමනාව
- සේවක අර්ථසාධක / භාරකාරත්ව අරමුදලේ හිමිකම
- වාර්ෂික ලාභ මත ගෙවනු ලබන දිරි දීමනා
- සේවකයා සහ ඔහු / ඇයගේ පවුලේ අය සඳහා වෛද්‍යාධාර ප්‍රතිපූර්ණය

ඉහත සියලු තනතුරු සඳහා අයදුම් කරන පුරවැසියන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමට බැඳි සිටිය යුතුයි.

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබාගත හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක අයදුම්පත්‍රයට ඇතුලත් කොට තම වෘත්තීය සහ අධ්‍යාපන සහතික සහ සේවා සහතිකවල, <u>**සහතික කරන ලද පිටපත්ද සමඟ සිය අයදුම්පත**</u> **2026.06.10** දින හෝ එදිනට පෙර අයදුම්කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ ඉහල වම් කෙලවරෙහි සඳහන් කර **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි** වෙත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානින් මඟින් එවිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. <u>**සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරික්ෂණය සඳහා කැඳවනු ලැබේ.**</u>


**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,**

**අංක 260, RTFC & WMC ගොඩනැගිල්ල,ලේක් ඩ්‍රයිව්, කොළඹ 05.**

**දුරකතන අංක - 011-2390645 – 011 -2390646 ෆැක්ස්- 011-2320758**